ලිංගික අපරාධයකට මුහුණ දුන් අයෙකුගේ අනන්‍යතාවය හෙළි නොකළ යුතු බව මාධ්‍ය ආචාර ධර්ම තුළ පැහැදිලිවම දක්වා ඇති කාරණයකි. එනම්, ලිංගික අපරාධයකට මුහුණ දුන් අයෙකුගේ අනන්‍යතාවය සෘජුවම හෙළිදරව් කිරීමේ හෝ වක්‍රාකාරීව හෙළිදරව් කිරීම, මාධ්‍ය විසින් කිසිසේත්ම නොකළ යුත්තකි. කෙසේ වෙතත්, මෙම මාධ්‍ය ආචාර ධර්මය මාධ්‍ය මගින් ආරක්ෂා නොකරන අවස්ථාවන්ද තිබේ.

1) පහත පුවත් වාර්තාව තුළ ලිංගික අපරාධයට මුහුණ දුන් බාලවයස්කාරිය සහ අදාළ සැකකරු අතර ඇති ඥාති සම්බන්ධතාවයත්, සැකකරුගේ අනන්‍යතාවයත් හෙළිදරව් කිරීම ඔස්සේ, ලිංගික අපරාධයට මුහුණ දුන් බාලවයස්කාරියගේ අනන්‍යතාවයද වක්‍රාකාරයෙන් හෙළිදරව් වී නැතිද?

2) ඒ අනුව මෙම පුවත් වාර්තාවේ ආචාර ධාර්මිකත්වය පිළිබඳ ඔබේ අදහස කුමක්ද?